ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2016 නොවැම්බර් මස 29 වැනි දින |

## 2016 අගෝස්තු මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

### සමස්ත නිරීක්ෂණ

වෙළඳ හිඟය පුළුල් වීම හමුවේ වුව ද සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල හිතකර වර්ධනයත් සමඟ 2016 අගෝස්තු මාසයේ දී විදේශීය අංශය මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය. 2016 අගෝස්තු මාසය තුළ දී අපනයන සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ ද ආනයන වර්ධනය වීමත් සමඟ වෙළඳ හිඟය පුළුල් විය. කෙසේ නමුත්, වෙළඳ ගිණුමෙහි බලපෑම අවම කරමින් සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය විය. මේ අතර, 2016 අගෝස්තු මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන සහ රජය වෙත වූ දිගුකාලීන ණය ලැබීම් මගින් මූල්‍ය ගිණුම ශක්තිමත් විය.

### අපනයන ක්‍රියාකාරිත්වය

2015 පෙබරවාරි මාසයෙන් පසුව ප්‍රථම වරට වර්ධනයක් පිළිබිඹු කරමින් 2016 අගෝස්තු මාසයේ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 866 ක් දක්වා 2015 අගෝස්තු මාසයට සාපේක්ෂව සියයට 8.4 කින් වර්ධනය විය. 2015 අගෝස්තු මාසයේ දී අපනයන ආදායම අඩු මට්ටමක පැවතීම මෙම වර්ධනය සඳහා යම් ප්‍රමාණයකින් හේතු විය.

පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අපනයන ආදායමෙහි සිදු වූ වර්ධනය සඳහා තේ සහ රබර් නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් දායක විය. තේ අපනයන ආදායමෙහි

වර්ධනය සඳහා කළු තේ අපනයන පරිමාව වැඩි වීම හේතු විය. කෙසේ වුවද, 2016 අගෝස්තු මාසයේ සාමාන්‍ය තේ අපනයන මිල 2015 අගෝස්තු මාසයේ පැවති අගයම විය (කිලෝග්‍රෑමයට එ.ජ.ඩොලර් 4.33). විශේෂයෙන් ශල්‍ය අත්වැසුම් හා අනෙකුත් අත්වැසුම් සහ රබර් ටයර් ඇතුළු රබර් නිෂ්පාදිත අපනයනවලට අයත් සියලුම උප කාණ්ඩවල වැඩිදියුණු වූ ක්‍රියාකාරිත්වය, රබර් නිෂ්පාදිත අපනයන වර්ධනය වීම සඳහා දායක විය. මීට අමතරව, යකඩ හා වානේ නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ, ආහාර, පාන වර්ග හා දුම්කොළ (විශේෂයෙන්ම එළවළු, පළතුරු හා කජු ආශ්‍රිත සැකසුම් සහ සකස් කළ දුම්කොළ) සහ කුළුබඩු (විශේෂයෙන්ම කුරුඳු, සාදික්කා හා වසාවාසි) ආදිය ද අපනයන වර්ධනය වීම සඳහා සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වුවද, 2016 අගෝස්තු මාසයේ දී ඇඟලුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.1 කින් අඩු විය. 2016 අගෝස්තු මාසයේ දී යුරෝපා සංගමය වෙත සිදු කළ ඇඟලුම් අපනයන 2015 අගෝස්තු මාසය සමඟ සැසඳීමේ දී සියයට 9.0 කින් වර්ධනය වූ අතර, අනෙකුත් වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන ද අඩු විය.

පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අගෝස්තු මාසයේ අපනයන ආදායමෙහි වර්ධනයක් පැවතිය ද, 2016 වසරේ පළමු මාස අට තුළ දී සමුච්චිත අපනයන ආදායම, 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 6,865 ක් දක්වා සියයට 4.1 කින් පහත වැටුණි. 2016 වසරේ පළමු මාස අට තුළ දී ඇඟලුම් අපනයන ආදායම, 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී සියයට 3.5 කින් වර්ධනය විය. කෙසේ වුවද, ඇඟලුම් අපනයන ආදායමින් ලැබූ මෙම වර්ධනය, ප්‍රවාහන උපකරණ, ඛනිජ තෙල් නිෂ්පාදිත (විශේෂයෙන්ම නැව් හා ගුවන් යානා සඳහා භාවිත කරන ඉන්ධන), තේ, කුළුබඩු (විශේෂයෙන්ම ගම්මිරිස් සහ කරාබු නැටි), මැණික් හා දියමන්ති අපනයන ආදායම්වල සිදු වූ අඩු වීම මගින් තුලනය වී ඇති අතර, ඉහත සඳහන් කළ මුළු අපනයන ආදායමේ සමුච්චිත අඩු වීම සඳහා මෙම කරුණු ද හේතු විය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ භාණ්ඩ අපනයන ගමනාන්ත ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය පැවති අතර එම රටවලට සිදු කළ අපනයන මුළු අපනයනයෙන් සියයට 53.0 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම

| කාණ්ඩය | 2015 අගෝ. (එ.ජ.ඩො. මිලියන) | 2016 අගෝ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-අගෝ. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-අගෝ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **618.2** | **654.3** | **5.8** | **5,455.0** | **5,314.7** | **(2.6)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 400.1 | 393.4 | (1.7) | 3,218.7 | 3,333.7 | 3.6 |
| රබර් නිෂ්පාදිත | 55.1 | 68.2 | 23.9 | 524.9 | 508.4 | (3.1) |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 19.4 | 28.6 | 47.9 | 197.3 | 200.2 | 1.5 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 18.5 | 25.6 | 38.6 | 174.3 | 199.5 | 14.5 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 25.3 | 23.0 | (8.9) | 289.4 | 185.4 | (35.9) |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 22.3 | 20.7 | (7.2) | 227.8 | 187.3 | (17.8) |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 10.7 | 14.5 | 35.6 | 95.0 | 115.7 | 21.7 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 2.9 | 12.9 | 336.9 | 38.1 | 55.8 | 46.5 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 9.6 | 5.2 | (46.2) | 32.6 | 17.7 | (45.7) |
| වෙනත් | 54.4 | 62.2 | 14.3 | 657.1 | 511.0 | (22.2) |
| **2. කෘෂිකාර්මික අපනයන** | **177.8** | **208.0** | **17.0** | **1,667.8** | **1,520.6** | **(8.8)** |
| තේ | 91.8 | 108.9 | 18.6 | 901.2 | 835.0 | (7.3) |
| කුළුබඩු | 30.1 | 35.7 | 18.9 | 249.3 | 194.1 | (22.1) |
| පොල් | 29.5 | 32.3 | 9.7 | 238.0 | 238.3 | 0.1 |
| මුහුදු ආහාර | 11.5 | 13.0 | 12.6 | 112.5 | 110.7 | (1.6) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 8.1 | 11.7 | 44.1 | 106.7 | 83.4 | (21.8) |
| රබර් | 1.7 | 2.3 | 32.4 | 17.8 | 20.9 | 17.2 |
| සකස් නොකළ දුම්කොළ | 3.3 | 2.2 | (33.2) | 22.5 | 19.9 | (11.6) |
| වෙනත් | 1.8 | 1.9 | 5.9 | 19.9 | 18.3 | (8.3) |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **2.9** | **4.0** | **38.0** | **32.6** | **29.9** | **(8.2)** |
| **මුළු අපනයන** | **798.9** | **866.3** | **8.4** | **7,155.4** | **6,865.2** | **(4.1)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

### ආනයන ක්‍රියාකාරිත්වය

2016 අගෝස්තු මාසයේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,649 ක් වූ අතර එය 2015 වසරේ අගෝස්තු මාසය සමඟ සැසඳීමේ දී සියයට 8.3 ක වර්ධනයකි. පෙර වසරේ අනුරූප මාසය සමඟ ආනයන වියදම් සැසඳීමේ දී, මෙම ආනයන වියදමේ වර්ධනය 2015 ජූනි මාසයට පසු වාර්තා වූ සැලකිය යුතු ඉහළම ආනයන වර්ධනය වේ. පෞද්ගලික රථවාහන ආනයන වියදම අඩු වීම මූලික කොට ගෙන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදමෙහි සිදු වූ අඩු වීම, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ යන කාණ්ඩ දෙකෙහිම

සිදු වූ වර්ධනය මගින් තුලනය වෙමින් සමස්ත ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී වර්ධනයක් කරා යොමු කරවීය.

අන්තර් භාණ්ඩ ආනයන වියදමෙහි වර්ධනය සඳහා රෙදිපිළි හා රෙදිපිළි උපාංග, රත්‍රන් සහ ඛනිජ නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, 2016 අගෝස්තු මාසයේ දී ආනයන වියදම පෙර වසරේ අනුරූප කාල පරිච්ඡේදයට සාපේක්ෂව වර්ධනය වීම සඳහා මෙම කාණ්ඩ තුන පිළිවෙළින් සියයට 52.4 කින්, සියයට 34.7 කින් සහ සියයට 14.4 කින් දායක විය. බොර තෙල්, පිරිපහදු කළ ඛනිජ තෙල් සහ ගල්අඟුරුවලින් සමන්විත වන ඉන්ධන ආනයන වියදම 2016 අගෝස්තු මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 3.2 කින් අඩු වූ අතර, බොර තෙල් ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 69 ක් දක්වා සියයට 13.3 කින් අඩු විය. බොර තෙල් ආනයන පරිමාව පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2.0 කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර, ආනයන මිල සැලකිය යුතු ලෙස සියයට 14.9 කින් අඩු විය. ආයෝජන භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2016 අගෝස්තු මාසයේ දී සියයට 18.1 කින් වර්ධනය වූ අතර, උප කාණ්ඩ සියල්ලකම පාහේ සිදු වූ වර්ධනයත් සමඟ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම සියයට 35.9 කින් වර්ධනය වීම මෙයට හේතු විය. ආර්ථිකයෙහි ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල වර්ධනයක් පිළිබිඹු කරමින් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ද පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 18.2 කින් වර්ධනය විය. ප්‍රවාහන උපකරණ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 17.6 කින් අඩු වූ අතර, මේ සඳහා ත්‍රීරෝද රථ සහ බස් රථ ආනයන වියදම අඩු වීම හේතු විය. කෙසේ වුවද, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 6.3 කින් අඩු වූ අතර, මේ සඳහා රථවාහන ආනයන බදු ඉහළ දැමීමත් සමඟ ආනයනය කළ පෞද්ගලික රථවාහන සංඛ්‍යාව අඩු වීම හේතුවෙන් රථවාහන ආනයන වියදම 2015 අගෝස්තු මාසයට සාපේක්ෂව 2016 අගෝස්තු මාසයේ දී සියයට 53.7 කින් අඩු වීම හේතු විය. අනෙකුත් සියලුම ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2016 අගෝස්තු මාසයේ දී වැඩි විය. ඒ අතරම, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආහාර හා පාන වර්ග ආනයන වියදම සියයට 17.8 කින් වර්ධනය වූ අතර සීනි, පාන වර්ග සහ කුළුබඩු ආනයන වියදම පිළිවෙළින් සියයට 80.9 කින්, සියයට 140.3 කින් සහ සියයට 73.3 කින් වර්ධනය විය. සීනි ආනයන වියදම ඉහළ යෑම සඳහා සීනි ආනයන පරිමාව සහ මිල යන දෙකෙහිම වර්ධනය හේතු විය.

සමුච්චිත වශයෙන් සැලකූ විට, 2016 වසරේ පළමු මාස අට තුළ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 12,403 ක් දක්වා ළඟා වෙමින් 2015 වසරේ පළමු මාස අට


අවසානයේ දී පැවැති අගයට සාපේක්ෂව සියයට 1.6 කින් අඩු වූ අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් පෞද්ගලික රථවාහන, ඉන්ධන, වාණිජ කටයුතු සඳහා භාවිතා කරන ප්‍රවාහන උපකරණ සහ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම අඩුවීම හේතු විය. කෙසේ වුවද, 2016 වසරේ පළමු මාස අට තුළ දී ඉන්ධන නොවන ආනයන වියදම 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.2 කින් වැඩි විය. චීනය, ඉන්දියාව, ජපානය, සිංගප්පූරුව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයන් වෙතින සිදු කරන ලද ආනයන මුළු ආනයනයෙන් සියයට 57.2 ක් පමණ විය.


## සංඛ්‍යා සටහන 2: ආනයන වියදම

| කාණ්ඩය | 2015 අගෝ. (එ.ජ.ඩො. මිලියන) | 2016 අගෝ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-අගෝ. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-අගෝ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **420.3** | **393.7** | **(6.3)** | **3,142.4** | **2,824.9** | **(10.1)** |
| ආහාර හා පානවර්ග | 121.1 | 142.6 | 17.8 | 1,124.4 | 1,039.1 | (7.6) |
| සීනි හා රසකැවිලි | 22.0 | 39.7 | 80.3 | 186.9 | 195.9 | 4.8 |
| කිරි නිෂ්පාදිත | 23.8 | 18.1 | (24.1) | 169.6 | 157.1 | (7.4) |
| පාන වර්ග | 5.7 | 13.7 | 140.3 | 49.6 | 63.1 | 27.4 |
| කුළුබඩු | 7.9 | 13.6 | 73.3 | 72.3 | 90.4 | 25.0 |
| තෙල් හා මේදය | 2.4 | 2.9 | 20.9 | 23.6 | 23.8 | 0.5 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 59.2 | 54.5 | (8.0) | 622.4 | 508.9 | (18.2) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 299.2 | 251.1 | (16.1) | 2,018.0 | 1,785.8 | (11.5) |
| රථ වාහන | 160.3 | 74.1 | (53.7) | 904.6 | 547.1 | (39.5) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 36.9 | 44.5 | 20.7 | 304.7 | 354.2 | 16.2 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 102.1 | 132.5 | 29.8 | 808.7 | 884.5 | 9.4 |
| **2. අන්තර් භාණ්ඩ** | **738.7** | **824.0** | **11.5** | **6,442.7** | **6,309.0** | **(2.1)** |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 154.2 | 220.0 | 42.7 | 1,547.4 | 1,764.7 | 14.0 |
| ඉන්ධන | 186.5 | 180.6 | (3.2) | 1,834.7 | 1,500.8 | (18.2) |
| රසායනික නිෂ්පාදිත | 84.0 | 66.5 | (20.8) | 585.8 | 568.1 | (3.0) |
| දියමන්ති සහ අගනා ගල් හා ලෝහ වර්ග | 3.9 | 53.8 | 1,274.4 | 131.3 | 299.3 | 128.0 |
| මූල ලෝහ | 48.0 | 34.3 | (28.6) | 325.9 | 249.5 | (23.4) |
| ඛනිජ නිෂ්පාදිත | 10.5 | 28.5 | 172.6 | 136.5 | 156.7 | 14.8 |
| තිරිඟු හා ඉරිඟු | 14.1 | 23.1 | 63.9 | 214.0 | 164.5 | (23.2) |
| වෙනත් | 237.6 | 217.1 | (8.6) | 1,667.1 | 1,605.5 | (3.7) |
| **3. ආයෝජන භාණ්ඩ** | **363.8** | **429.7** | **18.1** | **3,007.4** | **3,259.6** | **8.4** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 161.1 | 218.9 | 35.9 | 1,482.9 | 1,815.4 | 22.4 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 121.9 | 144.1 | 18.2 | 845.1 | 1,025.7 | 21.4 |
| ප්‍රවාහන උපකරණ | 80.5 | 66.3 | (17.6) | 676.3 | 414.3 | (38.7) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.3 | 0.3 | 3.0 | 3.0 | 4.1 | 36.8 |
| **4. වර්ග නොකළ ආනයන** | **0.5** | **1.7** | **214.0** | **11.5** | **9.4** | **(18.2)** |
| **මුළු ආනයන** | **1,523.4** | **1,649.1** | **8.3** | **12,604.0** | **12,402.9** | **(1.6)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

**වෙළඳ ශේෂය**

2015 අගෝස්තු මාසයට සාපේක්ෂව 2016 අගෝස්තු මාසයේ දී අපනයන ආදායම වැඩි වුව ද, ආනයන වියදමේ ඉහළ වර්ධනය 2016 අගෝස්තු මාසයේ දී වෙළඳ හිඟය එ.ජ. ඩොලර් මිලියන 783 ක් දක්වා වර්ධනය කිරීමට හේතු විය. 2016 අගෝස්තු මස අවසන් වන විට සමුච්චිත වෙළඳ හිඟය එ.ජ.ඩොලර් මිලියන 5,538 ක් වූ අතර එය 2015 වසරේ අගෝස්තු මස අවසන් වන විට පැවති සමුච්චිත වෙළඳ හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 89 ක වැඩිවීමකි.

**සංචාරක ඉපැයීම්**

2016 අගෝස්තු මාසය තුළ දී 186,288 ක පැමිණීම් සංඛ්‍යාවක් සමඟින් සංචාරක පැමිණීම් පෙර වසරේ අනුරූප මාසය සමඟ සැසඳීමේ දී සියයට 11.8 ක වාර්ෂික වර්ධනයක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේ පළමු මාස අට තුළ දී සංචාරක පැමිණීම් 1,359,906 ක් වූ අතර එය 2015 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ 1,172,465 ක සංචාරක පැමිණීම්වලට සාපේක්ෂව සියයට 16.0 ක වර්ධනයකි. සංචාරක පැමිණීම්වල ප්‍රධානතම මූලාශ්‍රය ලෙස අඛණ්ඩව ඉන්දියාව පැවති අතර අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර වන චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය යන රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සමඟ එම කාලපරිච්ඡේදය තුළ දී වූ මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 52.0 කට දායක විය. ඒ අනුව, 2016 වසරේ පළමු මාස අට තුළ දී සමුච්චිත සංචාරක ඉපැයීම්[1]

[1] සංචාරක ඉපැයීම් තාවකාලික ඇස්තමේන්තු වන අතර, 2016 වසර සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන ඇස්තමේන්තුගත සාමාන්‍ය දෛනික වියදම සහ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලසීමාව පිළිබඳව සිදු කෙරෙන සමීක්ෂණයේ වාර්තාව අනුව සංශෝධනය විය හැකිය.

2015 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,943.3 සමඟ සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 2,253.9 දක්වා වර්ධනය විය.

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ**

2016 අගෝස්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2015 අගෝස්තු මාසයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 566.0 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 618.3 ක් දක්වා සියයට 9.2 කින් හිතකර ලෙස වර්ධනය විය. මැදපෙරදිග රටවල ආර්ථිකයන්හි පවත්නා මන්දගාමී ස්වරූපය සහ නුපුහුණු අංශය යටතේ වන ශ්‍රම සංක්‍රමණ අඩු වීම මූලික වශයෙන් හේතු වෙමින් 2016 ජූලි මාසයේ දී වූ ලැබීම් පහළ යෑමේ පසුබිමක් තුළ වුව ද, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල මෙම වර්ධනය සිදු විය. මේ අතර, 2016 වසරේ පළමු මාස අට තුළ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මගින් වූ සමුච්චිත ලැබීම්, 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 4,598.0 හා සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 4,804.1 ක් දක්වා සියයට 4.5 කින් හිතකර ලෙස වර්ධනය විය.

**මූල්‍ය ලැබීම්**

2016 අගෝස්තු මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි වූ විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 6.7 ක මධ්‍යස්ථ ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, 2016 වසරේ පළමු මාස අට තුළ දී කොළඹ කොටස් වෙළඳපොළෙහි සමුච්චිත විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 24.1 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් වූ සමුච්චිත ගෙවීම්, ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ එ.ජ.ඩොලර් මිලියන 25.4 ක ගෙවීමකින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 1.4 ක ලැබීමකින් සමන්විත විය. 2016 අගෝස්තු මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ, විදේශීය ආයෝජන ලෙස වූ එ.ජ.ඩොලර් මිලියන 99.1 ක ලැබීමක් අඛණ්ඩව වාර්තා කළේය. කෙසේ වුවද, 2016 වසරේ පළමු මාස අට තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ සමුච්චිත විදේශීය ආයෝජන 2015 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 633.9 ක ශුද්ධ ගෙවීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 34.2 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. 2016 වසරේ පළමු මාස අට තුළ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය 2015 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 219.1 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 526.4 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2016 පළමු මාස අට තුළ දී සමස්ත ගෙවුම් තුලනය 2015 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 1,794.5 ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 211.5 ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2016 අගෝස්තු මාසය අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 4.2 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 6.6 දක්වා වැඩි වූ අතර මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.9 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 9.2 ක් විය.

2015 වසර අවසානයේ සිට 2016 නොවැම්බර් මස 28 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 2.6 ක අවප්‍රමාණය වීමක් වාර්තා කළේය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතික හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා රුපියල යූරෝවලට එරෙහිව සියයට 0.3 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 9.8 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 5.4 කින් සහ ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 4.9 කින් අවප්‍රමාණය වූ අතර, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 15.4 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 0.2 කින් ද අධිප්‍රමාණය විය.

## සංඛ්‍යා සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2015 අගෝ. (එ.ජ.ඩො. මිලියන) | 2016 අගෝ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-අගෝ. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-අගෝ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 798.9 | 866.3 | 8.4 | 7,155.4 | 6,865.2 | -4.1 |
| ආනයන | 1,523.4 | 1,649.1 | 8.3 | 12,604.0 | 12,402.9 | -1.6 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/හිඟය (-)) | -724.5 | -782.8 | 8.0 | -5,448.6 | -5,537.7 | 1.6 |
| සංචාරක ඉපැයීම් | 276.1(ආ) | 308.8 | 11.8 | 1,943.3(ආ) | 2,253.9 | 16.0 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 566.0 | 618.3 | 9.2 | 4,598.0 | 4,804.1 | 4.5 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | -32.2 | 6.7 | 120.9 | 7.8 | -24.1 | -407.2 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 472.1 | 355.3 | -24.7 | 2,442.7 | 3,667.3 | 50.1 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 372.1 | 127.1 | -65.8 | 1,003.4 | 1,036.5 | 3.3 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 650.0 | 1,500.0 | 130.8 |
| ඒකාබද්ධ ණය පහසුකම | - | - | - | - | 300.0 | - |
| දිගුකාලීන ණය | 99.6 | 228.2 | 129.1 | 729.5 | 1,117.2 | 53.2 |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 533.8 | 335.9 | -37.1 |

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් වේ.